**සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**(සිංහල භාෂා ඒකකය)**

**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2023**

**පාසල් මට්ටම**

1) අපේක්ෂකයාගේ නම :- ..........................................................................

(මුලකුරු සමඟ නම පැහැදිලිව ලියන්න.)

2) විදුහලේ නම හා ලිපිනය :- ....................................................................

..............................................................................................................

3) පාසල් වර්ගය :- 200 ට අඩු/ 201-500/ 501 ට වැඩි

4) කලාපය :- ...............................................................................................

5) කොට්ඨාසය :- .........................................................................................

---

**සාහිත්‍ය දැනුම මිනුම**

**10 ශ්‍රේණිය** **කාලය පැය 03 යි.**

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01) පහත දැක්වෙන නිර්මාණ රචනා කළ ලේඛකයන්ගේ නම් තිත් ඉරි මත ලියන්න.

I. මඩොල්දූව ---------------------------------

II. දිට්හ ආන කෙටිකතාව ---------------------------------

III. වෙසක් පහන ---------------------------------

IV. සද්ධර්මරත්නාවලිය ---------------------------------

V. “පියසමර ” පද්‍ය සංග්‍රහය ---------------------------------

VI. ලෝවැඩ සඟරාව ---------------------------------

VII. ගුත්තිල කාව්‍යය ---------------------------------

VIII. අමාවතුර ---------------------------------

IX. හුණුවටයේ කතාව ---------------------------------

X. මධ්‍යකාලීන සිංහල කලා ---------------------------------

(ලකුණු 10)

02) පහත සඳහන් පාඨ උපුටා ගත් පාඩමේ නම, කීවේ කවුරුන් විසින් ද, කීවේ කාට ද, කුමන අවස්ථාවේ ද යන කරුණු දක්වා වගුව සම්පූර්ණ කරන්න.

I. “ ඇතුළු නුවර දී රහස් කියන්නට නොපුළුවන. මඟුල් උයනට යම්හ”

II. " කෙහෙල්මල් වෛද්‍ය පරීස්සනේ..මළඉලවු වටිනාකම......"

III. “ පුත, ඔබ බෝසත්වරයෙකි, ඔබට බුදු බව ලැබේවා”

IV. “ තෝව උල තියා මරාවි - නැත්තං පෙති ගහල දාවි”

V. “ දැන් ම සකන්වැ ගියේය. නැවැත අට කනකට ගොස්..........”

| පාඩමේ නම | කවුරුන් විසින්ද? | කිවේ කාටද? | කුමන අවස්ථාවේද? |
|---|---|---|---|
| | | | |

(ලකුණු 20)

03) පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨවල තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලිහිල් බසින් ලියන්න.

(අ) කන් කලු වෙණ නද ඇසුමෙහි ලොබිනේ
රන් රසුදූල් කොලහල වන බියෙනේ
**සන්සල** නොව එහි **පිළිරූ** ලෙසිනේ
නන් **හයසෙන්** සිටියෝ සිටි මතිනේ

I. ලොබිනේ - ------------------------------------------------------------

II. රසු ඇල් - ------------------------------------------------------------

III. සන් සල නොව - ------------------------------------------------------------

IV. පිළිරූ - ------------------------------------------------------------

V. හයසෙන් - ------------------------------------------------------------

(ලකුණු 10)

04) පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

I. " කියවන නුවණ " ග්‍රන්ථයේ රචකයා කවුද?

---------------------------------------------------------------------------------

" නන්දන ගීත " පද්‍ය සංග්‍රහය රචනා කළේ කවුද?

---------------------------------------------------------------------------------

පූජාවලිය ගද්‍ය කෘතිය රචනා කළ යුගය ලියන්න.

---------------------------------------------------------------------------------

සැළලිහිණි සන්දේශය ලියූ කතුවරයාගේ නම ලියන්න.

---------------------------------------------------------------------------------

" පාලි ජාතකට්ඨ කතාව " මූලාශ්‍ර කොට ගෙන ලියැවී ඇති ග්‍රන්ථය කුමක්ද?

---------------------------------------------------------------------------------

(ලකුණු 10)

05) පහත දැක්වෙන කව්වල ඉතිරි පද සම්පූර්ණ කරන්න.

I. ගුත්තිල ඇදුරු සඳ

--------------------------------------------------

පසෙක පනවන ලද

--------------------------------------------------

II. පෙම්මා සුරතල් කියමින් දෙතනේ කිරි බොම්මා

--------------------------------------------------

--------------------------------------------------

සම්මා සම්බුදු වන දා නිවන් දකින් අම්මා

III. --------------------------------------------------

ආගම මිණි පහනක් වේ

එය රැකගන්නට මෙලොවේ

සමත් වෙතොත් පුත නුඹ වේ

(ලකුණු 10)

06) පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද ඉදිරියෙන් ලකුණු කරන්න.

I. " මල් මල් වාරම් හරි මැ උදාරම්" ගීතය දේශාභිමානී ගීතයකි. (---------)

II. " තත මතු ද සින්දේ " පද්‍ය සමුද්‍රඝෝෂ විරිතෙන් රචනා වූවකි. (---------)

III. " වර්චස් " යනු ගෙලෙහි බඳින මාලයකි. (---------)

IV. "ඇසේ මතුවන කඳුළු බිඳු ගෙන" මහගම සේකරයන් ලියූ ගීයකි .(---------)

V. මහාසාර නාට්‍යය හාස්‍යෝත්පාදක නාට්‍යයකි. (---------)

(ලකුණු 10)

07) පහත සඳහන් පද්‍ය පන්තිය කියවා ඔබට ඇතිවන හැඟීම් වචන 75කින් පමණ ලියන්න.

ඔබ වෙනුවෙන් ඉදෙන බතේ
සිනා හඬට කන් දී ගෙන
සිඹ මොළවන විට ලිප ගිනි
දෙව් බොජුනක රස මැවෙන්න
දැසේ නිල් පැහැය ඇවී
සෙමෙන් තුරන් විය නොදැනිම

නැවතත් එන බව නොකියා
හිරු අවරින් නැව් නැගි පසු
තනිව හඬනව ලොවත් සමඟ
රැයට මහුණලා ඉඳගෙන
ඔබ එනතුරු මග බලමින්
දවි ගණනක් ගෙවෙනා විට
දැසේ නිල් පැහැය සෙමෙන්
අඳුරට දිය විය නොදැනිම

බත් දෙකටක් උපයන්නට
අටු කොටු පුරවා දවසෙම
මඳ සැනසිල්ලක් ලබමින්
නිදි පැදුරේ වැතිරෙන ඔබ
නඟන සුසුම් කෙඳිරිලි හඬ
හද මිරිකා හළ කඳුළට
දැසේ නිල් පැහැ සේදී
ගලා නිමා විය නොදැනිම

නිල් ඉඳුවර නිලේ අරුම
ඈත දියඹ නිලේ වරුණ
යොවුන් වියේ නිල් දෑසට
උවම් නැතැයි කී හිමියනි
අතීතයක් ගැන සිතමින්
මගේ දෑස දෙස නොබලා
අනාගතය දෙස යොමු වූ
දුවගෙ දෑස දෙස බලන්න.

(ලකුණු 30)